# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. *පංතිය - 13
   *විෂය - ඉතිහාසය
   *අදාළ සතිය - ඔක්තොම්බර් 2

2. පාඩම හෝ ඒකකය - 11.නිදහසින් පසු ශ්‍රී ලංකාව
   ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කරයි.
   11.3 ස්වාධීන රාජ්‍යයක් ලෙස විදේශ රාජ්‍ය සමඟ කටයුතු කළ ආකාරය විමසා බලයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1.නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව ඔබ දන්නා දෑ මතකයට ගන්න.
   2.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   3. නිදහසින් පසු 1947 සිට 1956 තෙක් බ්‍රිතාන්‍යය සමඟ බැඳීමකින් කටයුතු කළ ආකාරය පිළිබඳව පොතපතින් කරුණු රැස් කරගන්න.
   4. නිදහසින් පසු 1956 සිට 1965 දක්වා නොබැඳි පිළිවෙතක් අනුගමනය කළ ආකාරය පිළිබඳ වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.
   5.නිදහසින් පසු 1965-1970 හා 1970-1977 කාල වකවානුවල විදෙස් පිළිවෙත පිළිබඳ කරුණු ඇතුළත් අත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/resource/view.php?id=27591

   2. ඊ නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=27575

   3. ගුරු ගෙදර - නැත

   4. වෙනත් - යූ ටියුබ් - නැත

5. අතිරේක පොත්/සඟරා - ශ්‍රී ලංකාවේ ඉතිහාසය,අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සංක්ෂිප්ත ලංකා ඉතිහාසය,ඇස්.බී.හෙට්ටිආරච්චි

6.මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -

1. නිදහස් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති විග්‍රහ කරයි.
2.ශ්‍රී ලංකාව විදේශීය අවධානයට යොමු වීමට හේතු පහදයි.
3.ශ්‍රී ලංකාව සමඟ මිත්‍ර සම්බන්ධතා පැවැත්වූ රටවල්,සිතියමක ලකුණු කරයි.

7.තක්සේරුව හා ඇගයීම -

1. නිදහසින් පසු 1978 දක්වා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වරූපය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
2. නිදහසින් පසු මුල් අවධියේ බටහිරට නැඹුරු වූ විදේශ ප්රතිපත්තිය 1970-77 වන විට ක්‍රමයෙන් වෙනස් වූ ආකාරය පැහැදිලි කරන්න.

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -